# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/56 - 2018 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

**බදුල්ල නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්පත් කරගැනීම**

*ඉඩම් සංවර්ධන අමා. යොමු අංකය* - 3J/91/UDA/184
*මාගේ අංකය* - BD/BD/LND/3/5/1/i

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුලු කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර (78බී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කැඳලගම, කොට්ඨාස අංක 10 - බදුල්ල මධ්‍යම, (බදුල්ල මහ නගර සභා සීමාව තුල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට බදුල්ල දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද, අංක බ. 508 හා 1999.10.27 දිනැති මූලික පිඹුර සහ 2018.08.24 දිනැති මූලික පිඹුරු අංක බ. 508 ට අදාල පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුව අනුව හෙක්ටයාර 0.0119 ක් වූ ප්‍රමාණයට පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල හා මායිම් ඇතුළත් උපලේඛනය - 01

කැබලි අංක 4

ඉඩමේ නම: පණ්ඩිතගෙදර වත්ත සහ රදලවත්ත, වරිපනම් අංක 3A, තැපැල් කන්තෝරුව පාර; ඉඩමේ විස්තරය: මාර්ගය (කොටසක්); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: මූ.පි.බ. 508 හි 4 වැනි බිම් කැබැල්ල. මායිම් පාදා හරි වැරදි බලන ලදී. අත්කරගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නේ දෙහිවල, කලුබෝවිල, පීරිස් මාවතේ, අංක 17 හි පදිංචි ලිලියන් පීරිස්. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0119.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018.11.05 වැනි දින පෙ.ව. 10.30ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2018.10.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම, ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එන්. එම්. ඥාණවතී,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2018 ඔක්තෝබර් මස 01 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

10-990

1A - G28659– 12 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*